www.xtrapapers.com

M12/1/A1SIN/SP2/SIN/TZ0/XX

22120268

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 2**

Tuesday 15 May 2012 (morning)
Mardi 15 mai 2012 (matin)
Martes 15 de mayo de 2012 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied. You may include in your answer a discussion of a Part 2 work of the same genre if relevant. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is [25 marks].

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. Vous devez baser votre réponse sur au moins deux des œuvres de la 3e partie que vous avez étudiées. Le cas échéant, vous pouvez inclure dans votre réponse une discussion sur une œuvre du même genre littéraire étudiée dans la 2e partie du programme. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la 3e partie n'obtiendront pas une note élevée.
- Vous n'êtes pas autorisé(e) à amener des exemplaires des œuvres que vous avez étudiées dans la salle d'examen.
- Le nombre maximum de points pour cette épreuve d'examen est [25 points].

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Elija un tema de redacción. Su respuesta deberá basarse en al menos dos de las obras estudiadas en la Parte 3. Se podrán hacer comentarios sobre una obra de la Parte 2 del mismo género, si fuera necesario. Las respuestas que no incluyan una discusión sobre al menos dos obras de la Parte 3 no recibirán notas altas.
- No se permite traer a la sala de examen copias de las obras estudiadas.
- La puntuación máxima para esta prueba de examen es [25 puntos].


© International Baccalaureate Organization 2012

www.xtrapapers.com



**පහත සඳහන් මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. 3 වන කොටසේදී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතුය.**

**අදාළ නම් 2 වන කොටසේ ග්‍රන්ථ අතුරින් එම සාහිත්‍යාංගයටම අයත් කිසියම් කෘතියක් ගැන වුවද පිළිතුරේදී සාකච්ඡා කළ හැකිය. 3 වන කොටසින් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.**

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** **"සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල අන්තර්ගත චරිත පහසුවෙන්ම 'සුදන' හෝ 'දුදන' යනුවෙන් වර්ග කළ හැකිය." එම කතුවරුන් කවර ශිල්ප ක්‍රම මගින්, කොතෙක් දුරට සාර්ථක ලෙස එම වර්ග දෙක ඉදිරිපත් කර ඇද්දැයි ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් විමසන්න.**

**2.** **ඔබ හදාරා ඇති සම්භාව්‍ය සාහිත්‍ය කෘති දෙකක විශේෂ සාහිත්‍යමය ලක්ෂණයක් ලෙස අතිශයෝක්තිය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.**

**නාට්‍ය කලාව**

**3.** **ඔබ හදාරා ඇති නාට්‍ය කෘති අතුරෙන් දෙකක සාර්ථකත්වය සඳහා ඒවායේ කවර නාට්‍යමය ලක්ෂණ හේතු වී ඇද්දැයි විමසන්න.**

**4.** **නූතන නාට්‍ය කරුවන් සාම්ප්‍රදායික කතා වස්තු කවර ආකාරයේ නව දෘෂ්ටි කෝණවලින් හා කොතෙක් දුරට සාර්ථක ලෙස ඉදිරිපත් කිරීමට සමත් වී ඇද්ද යන්න ඔබ හැදෑරූ නාට්‍ය දෙකක් ආශ්‍රයෙන් විමසන්න.**

**නවකථාව**

**5.** **"නවකථාවකින් නිරූපණය වන චරිත සැබෑ ලෝකයේ ජීවත් වන නිශ්චිත පුද්ගලයන්ම නොව එවන් පුද්ගලයන් සමූහයකගේ චරිත ලක්ෂණවල සංකලනයක් ලෙස ගත හැකි විවිධාකාර සමාන අසමාන ලක්ෂණවලින් හෙබි චරිත වෙයි." ඔබ හදාරා ඇති නවකථා දෙකක් ඇසුරින් විමසන්න.**

**6.** **ඔබ හදෑරූ නවකථා අතුරෙන් දෙකක් තෝරාගෙන එම කෘතීන්හි සාර්ථකත්වයට, කතුවරුන් යොදාගත් විශේෂ ශිල්ප ක්‍රම හා කුසලතා උපයෝගී වී ඇති ආකාරය විමසන්න.**

www.xtrapapers.com



**කාව්‍යය**

7. ඔබ හදාරා ඇති පද්‍ය රචකයන් දෙදෙනකුගේ කෘති දෙකක ප්‍රධාන තේමාවන් හා ඒවා ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳ සන්සන්දනාත්මක ඇගයීමක් කරන්න.

8. නිර්මාණාත්මක ලෙස උපමා හා රූපක භාවිතය පද්‍ය රචනයක සාහිත්‍යමය අගය වැඩි වීමට කොතෙක් දුරට හේතු වේදැයි ඔබ හදාරා ඇති කවියන් දෙදෙනකුගේ කෘති ඇසුරෙන් විමසන්න.

**කෙටිකතා**

9. "තේමාව, කෙටිකතාවක වැදගත් අංගයකි." මෙම අදහස ඔබ හදාරා ඇති ලේඛකයන් දෙදෙනකුගේ කෘති ඇසුරු කරගනිමින් පැහැදිලි කරන්න.

10. නූතන කෙටිකතා කරුවන් සිය නිර්මාණවල භාෂාව යොදාගැනීම අතින් කෙබඳු දක්ෂතාවක් පෙන්නුම් කර ඇද්දැයි ඔබ හදාරා ඇති කෙටිකතා කරුවන් දෙදෙනකුගේ කෘති ඇසුරෙන් විමසන්න.

**පොදු ප්‍රශ්න**

11. "සාහිත්‍ය කෘතියක් මගින් අප සිත් තුළ රස දැනවීම වඩාත් ප්‍රබල ලෙස සිදු වන්නේ එහි නිරූපිත සිද්ධි හා චරිත යථාර්ථවත් ලෙස ඉදිරිපත් වී ඇති විටය." ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරු කරගනිමින් මේ අදහස විමසන්න.

12. "සමාජය තුළ සිදු වන විපර්යාස දෙස මධ්‍යස්ථව බලා කලාත්මකව නිරූපණය කිරීමේ හැකියාවක් ප්‍රතිභාපූර්ණ ලේඛකයා සතුව පවතී." මෙම අදහස කොතෙක් දුරට පිළිගත හැකිද යන්න ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් විමර්ශනය කරන්න.

13. ඔබ හදාරා ඇති කෘති අතුරෙන් දෙකක් තෝරා ගනිමින්, ඒවායින් සමාජය වෙත ඉදිරිපත් කෙරෙන මූලික අරුත් මොනවාදැයි නිදසුන් සහිතව දක්වන්න.

14. ඔබ හදාරා ඇති සාහිත්‍ය කෘතිවල මිනිස් ජීවිතයේ සංකීර්ණත්වය කොතරම් දුරට ප්‍රබල ලෙස හා සාර්ථක ලෙස නිරූපණය වී ඇද්ද? අදාළ කෘති දෙකක් ඇසුරෙන් විමසන්න.

---